**ශීර්ෂය 422 දහම් පාසල් , පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

දහම් පාසල් ,පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දහම් පාසල් ,පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුනි 03 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 අගෝස්තු 31 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට දහම් පාසල් ,පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

සමාලෝචිත වර්ෂය තුල ස්ථාපිත කරන ලද නව රාජ්‍ය අමාත්‍යාංශයක් වූ බැවින් මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සඳහා පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

**මූලධන වියදම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ මූලධන වත්කම් පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම් යටතේ රු.1,553,872 ක්ද, මූලධන වත්කම් අත්පත්කර ගැනීම් යටතේ රු. 159,236,292 ක්ද දක්වා ඇතත් එම තොරතුරු මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි. | 2021 වර්ෂයේ දී මෙම දෝෂයන් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවීම. |

## 1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**ආදායම් නොවන ලැබීම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ආදායම් නොවන ලැබීම් තීරුවෙහි වෙනත් දෙපාර්තමේන්තු විසින් ගෙවනු ලැබූ ශුද්ධ ණය රු.84,624,538 ක් දක්වා තිබුණි. | අත්තිකාරම් B ගිණුමට අදාලව ණය අයකරගැනීම් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් වර්ෂ අවසානයේ භාණ්ඩාගර මුද්‍රිත පිටපත් අනුව අපගේ වැය ශීර්ෂයට මාරු කර ඇත. එම ලැබීම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් ලෙස සටහන් කර ඇති බව | ආදායම් නොවන ලැබීම් නිවැරදිව සටහන් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) වෙනත් දෙපාර්තමේන්තු/ අමාත්‍යාංශ මගින් එකතු කරන ලද ආදායම් තීරුවෙහි රු.4,528,321,306 ක වියදමක් දක්වා තිබුණි. | අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කරන ලද මුළු වියදමට අදාල අක්මුදල් අප රාජ්‍ය අමාත්‍යාංශයේ වෙනත් දෙපාර්තමේන්තු / අමාත්‍යාංශ මගින් එකතු කරන ලද ආදායමක් ලෙස සටහන් කරන ලද බව. | ආදායම් තීරුවෙහි ආදායම් දැක්වීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් රු. 499,998 ක් වුවත් රු.4,129,127,641 ක් ලෙස දක්වා තිබුණි. | 2020 දෙසැම්බර් මස තුලදී ලද අක්මුදල් ප්‍රමාණය වන රු.500,000 මගින් වියදම් කළ ප්‍රමාණය රු.499,998 ක් වුවත් , රේඛීය අමාත්‍යාංශය විසින් ගිණුම් කටයුතු ආරම්භයේ සිට එනම් 2020 අගෝස්තු මස සිටම සිදු කරගෙන ගිය බැවින් අප රාජ්‍ය අමාත්‍යාංශයට අදාල සියලු පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් මෙමගින් පෙන්නුම් කර ඇති බව. | නිවැරදි වියදම දැක්වීමට කටයුතු කළ යුතු වීම. |
| (ඈ) අමාත්‍යාංශයට අදාලව සහනාධාර සහ මාරු කිරීම් නොමැති වුවද එම තීරුවෙහි රු.238,523,559 ක් දක්වා තිබුණි. | සහනාධාර හා මාරු කිරීම් යටතේ රජයේ සේවකයින් සඳහා ලබා දෙනු ලබන දේපළ ණය පොළී (1506) හා පිරිවෙන් සඳහා ලබා දෙනු ලබන වාර්ෂික පිරිවෙන් ආධාරය (1508) සටහන් කර ඇති අතර එම වැය විෂයයන් සඳහන් කිරීමට මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයේ වෙනත් තීරුවක් නොමැති බැවින් එම තීරුවේ සටහන් කරන ලද බව. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි තොරතුරු සටහන් කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | අමාත්‍යාංශයේ අත්තිකාරම් අයකර ගැනීම් නොමැති වුවද ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ අත්තිකාරම් අයකර ගැනීම් ලෙස රු. 29,615,325 ක් දක්වා තිබුණි. | රාජ්‍ය අමාත්‍යාංශයේ අත්තිකාරම් අයකර ගැනීම් රේඛීය අමාත්‍යාංශය විසින් සිදුකළ අතර වර්ෂය තුළ සියලුම බැර කිරීම් එනම් මුදලින් හා හරස් සටහන් 422 ශීර්ෂයට වර්ෂය අවසානයේ බැර කර ඇති බැවින් මෙසේ දක්වා ඇත. | නිවැරදි තොරතුරු සටහන් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඊ) | අමාත්‍යාංශය රු. 499,998 ක වියදම් පමණක් දරා තිබියදී මුදල් වැය කිරීම් යටතේ භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් ලෙස රු. 161,170,104 ක් ද අත්තිකාරම් ගෙවීම් ලෙස රු.114,239,864 ක් ද අමාත්‍යාංශයේ වැය කිරීම් ලෙස දක්වා තිබුණි. | අක්මුදලේ වියදම රු.499,998 ක් වුවද රේඛිය අමාත්‍යාංශය විසින් අමාත්‍යාංශය වෙනුවෙන් දරන ලද වියදම් රාජ්‍ය අමාත්‍යාංශය යටතේ දක්වා ඇත. | නිවැරදි තොරතුරු සටහන් කිරීමට කටයුතු කළ යුතු වීම. |

**1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශය විසින් සාමාජික ණය ලේඛනය අදාළ තීරු සම්පූර්ණ කර විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | 2021 වර්ෂය සඳහා සියලුම ලේඛන අමාත්‍යාංශය මඟින් පවත්වාගෙන යාමට කටයුතු කර ඇත. | සාමාජික ණය ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වාගත යුතුවේ. |

**1.6.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට | ඔබගේ නිරීක්ෂණ හා එකඟ වේ. 2020 වර්ෂයේ අගෝස්තු මස සිට මෙම රාජ්‍ය අමාත්‍යාංශය පිහිට වූ අතර පියවරෙන් පියවර අභ්‍යන්තර පාලන පද්ධතිය සකස්කරමින් අමාත්‍යාංශයට කටයුතු කිරීමට සිදු වී | විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. |

| | | |
|---|---|---|
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ඇත. 2021 වර්ෂය සඳහා මුදල් රෙගුලාසි 135 අනුව බලතල බෙදාහැරීම වැනි මූලික අභ්‍යන්තර පාලන ක්‍රම ක්‍රියාත්මක කර ඇත. වර්ෂයේ ඉදිරි කාලය තුල එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳ සමාලෝචනයක් කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | |

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 වියදම් කළමනාකරණය**

--------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 09 ක් යටතේ සලසා තිබූ රු. 16,700,000 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි. | ඔබගේ නිරීක්ෂණ හා එකඟ වන බව. | අවශ්‍යතාවය අනුව නිවැරදි ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කළ යුතුවීම. |
| (ආ) වැය විෂයයන් 12 ක 14,985,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. 6,937,741 ක් ඉතිරි වී තිබුණු අතර එය සියයට 29 සිට සියයට 94 දක්වා පරාසයක් ගෙන තිබුණි | අපේක්ෂිත වියදම් පැන නොනැගීම,බිල්පත් නිසි පරිදි ඉදිරිපත් නොවීම ආදී හේතු නිසා ප්‍රතිපාදන ඉතිරි වූ බව. | අවශ්‍යතාවය අනුව නිවැරදි ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කළ යුතුවීම. |

**2.2** **බැරකම් හා බැදීම්වලට එළඹීම**

**----------------------------------**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද බැරකම් පිළිබඳ ප්‍රකාශයේ රු. 264,856,794 ක බැරකම් දක්වා ඇතත් භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන අනුව බැරකම් රු. 66,954 ක් පමණක් දක්වා තිබුණි. | 2021 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදි නිවැරදිව වාර්තා කිරීමට සටහන් කර ගත් බව. | බැරකම් නිවැරදිව සටහන් කිරීමට කටයුතු කළ යුතු වීම. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**----------------------------**

**3.1** **කළමනාකරණ දුර්වලතා**

**----------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- | --- |
| (අ) | 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතට නව සංශෝධිත එක් කරමින් 2018 වර්ෂයේදී සකස් කර ඇති පනත් සංශෝධන කෙටුම්පත නීතිපතිවරයාගේ අනුමැතිය වෙත යවා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් පිරිවෙන් අධ්‍යාපන පනත සංශෝධනය වී නොතිබුණි. | අවශ්‍ය වෙනස්කම් සිදු කිරීමට අදාළ නිර්දේශ මේ වන තුරු ලැබී නොමැති බව. | පිරිවෙන් අධ්‍යාපන පනත සංශෝධනය කර ගැනීමට අදාළ නිර්දේශ ලබා ගැනීමට නොපමාව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ කාර්ය මණ්ඩලය සඳහා අනුමත කාර්ය මණ්ඩලයක් ස්ථාපිත කර නොතිබුණු අතර, සහකාර පිරිවෙන් අධ්‍යක්ෂ හිමිවරුන් හැර දැනට බඳවාගෙන සිටින කාර්ය මණ්ඩලයට අනුමැතියක් ලබා ගෙන නොතිබුණි. | පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ හා පිරිවෙන් අධ්‍යාපන අංශයේ කාර්ය නියුක්ත අනෙකුත් සියලුම මාණ්ඩලික නිලධාරි, පරිවේණාචාර්ය ආදී තනතුරු සඳහා කාර්ය මණ්ඩල අනුමත කර ගැනීමට වැඩ පිළිවෙළක් සකසා ඇති බව. | කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පිරිවෙන් තුල පවතින මූලික ශ්‍රේණි සඳහා ප්‍රාථමික අධ්‍යාපනයට ගැලපෙන සේ විෂය නිර්දේශයක්ද පිරිවෙන් අධ්‍යාපන ශාඛාව ජාතික අධ්‍යාපන ආයතනය සමඟ එක්ව පිළියෙල කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ආයතන මට්ටමින් සකස් කර ගත් විෂය නිර්දේශයක් අනුව මූලික ශ්‍රේණියෙහි ඉගැන්වීම් සිදු කරනු ලබයි. මූලික ශ්‍රේණිය සඳහා විෂය මාලාවක් සකස් කර නොමැති බැවින් ඒ සම්බන්ධයෙන් මේ වන විට පියවර ගනිමින් සිටින බව. | මූලික ශ්‍රේණිය සඳහා විෂය මාලාවක් සකස් කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | "වතුරුවිල ශ්‍රී ඥාණානන්ද පිරිවෙන වෙත අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් යුතුව ගෙවන ලද රු. ලක්‍ෂ 5 ක වාර්ෂික ආධාර මුදල රු.ලක්‍ෂ 10 දක්වා වැඩිකිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබා නොගෙන 2017 වර්ෂයේ සිට රු. ලක්ෂ 10 බැගින් ගෙවා තිබුණි. | වතුරුවිල ඥාණානන්ද වනවාස පිරිවෙන කරන ලද ඉල්ලීම අනුව 184 වෙනි පිරිවෙන් අධ්‍යාපන මණ්ඩලයෙන් වාර්ෂික ආධාර මුදල රුපියල් ලක්ෂ 10 දක්වා වැඩි කිරීමට අනුමැතිය ලබා දී ඇත. ඒ සඳහා අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කර නැති බවත් 2017 වර්ෂයේ සිට රුපියල් ලක්ෂ 10 බැගින් ගෙවා ඇති බවත් සඳහන් කොට 2020.03.31 දින පැවති 185 පිරිවෙන් අධ්‍යාපන මණ්ඩලයේ උපදෙස් පත්‍රිකා අංක 16 යටතේ ඉදිරිපත් කර ඇති බව. | විධිමත් අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කළ යුතුවීම. |

**4. යහපාලනය**

--------------

**4.1 අභ්‍යන්තර විගණනය**

----------------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව අභ්‍යන්තර විගණකයකු පත් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2021 ගණකාධිකාරි වාර්ෂික ස්ථාන මාරු යටතේ නිලධාරියකු අභ්‍යන්තර විගණක තනතුර සඳහා ස්ථාන මාරු ලබා පැමිණීමට නියමිතව ඇත. ඒ අනුව අභ්‍යන්තර විගණන කාර්යන් සිදුකිරිමට කටයුතු කරනු ලබන බව. | විගණන පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. |

## 4.2 විගණන හා කළමනාකරණ කමිටුව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට කටයුතු කර නොතිබුණි. | 2020 වර්ෂයේ අගෝස්තු මස සිට රාජ්‍ය අමාත්‍යාංශය පිහිටුවීම හා රටේ පැවති අයහපත් තත්වය හේතුවෙන් 2020 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටුව පත් කිරිම සහ රැස්විම සඳහා කාලය ප්‍රමණවත් නොවූ අතර 2021 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටුව පැවැත්විමට කටයුතු කරනු ලබන බව. | විගණන පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත, කාර්ය මණ්ඩලය 78 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 63 ක් වූයෙන් පුරප්පාඩු 15 ක් පැවතුණි. | අධ්‍යාපන අමාත්‍යාංශය මගින් 11 ක් තාවකාලිකව අනුයුක්ත කර ඇත. මේවන විට පුරප්පාඩු 17 ක් පවතින අතර ඉදිරියේදි මෙම පුරප්පාඩු ද සම්පූර්ණ කර ගැනීමට කටයුතු කරනු ලබන බව. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |